IHRA
UNIVERSITY OF COLOMBO

00 [illegible]4

# මානව සම්පත් අභිවර්ධන ආයතනය

## කොළඹ විශ්වවිද්‍යාලය

## ශ්‍රම අධ්‍යාපනවේදී උපාධි පාඨමාලාව I කොටස - 2017/18
## (දෙවන සෙමෙස්තරය)

පවත්වන ලද්දේ 2020 අගෝස්තු

## BLE105 - නෛතික පරිසරය

අයදුම්කරුවන්ට උපදෙස්

(1) ප්‍රශ්න පහකට (05) පමණක් පිලිතුරු සපයන්න.

නඩු තීන්දු හා අදාළ ව්‍යවස්ථාපිත ප්‍රතිපාදන පිළිතුරු තුළ අන්තර්ගත විය යුතුය. අපැහැදිලි අත් අකුරු සඳහා ලකුණු අඩු කෙරේ.

(2) ප්‍රශ්න පත්‍රය ප්‍රශ්න අටකින් (08) හා එක් (01) පිටුවකින් සමන්විත වේ.

(3) කාලය පැය තුනයි. (03)

(4) පිළිතුරු පත්‍රයේ සියලුම පිටුවල විභාග අංකය යොදන්න.

(5) ප්‍රශ්න පත්‍රයේ යම් පිටුවක් හෝ කොටසක් පැහැදිලිව මුද්‍රණයවී නොතිබේ නම් කරුණාකර වහාම ඒ බව ශාලාධිපතිට දැනුම් දෙන්න.

1) 'ශ්‍රී ලංකාවේ පවතින බහු විධ නීති පද්ධතිය විවිධ ආගම් හා ජන වර්ග අතර සංහිඳියාව වර්ධනය සඳහා බලපාන අතරම, එය මගින් අනෙක් අතට නීති පද්ධතිය සංකීර්ණ කිරීමක්ද සිදු කරනු ලබයි.'

ඉහත ප්‍රකාශය සමඟ ඔබ එකඟ වන්නෙහිද?
ඔබේ පිළිතුර සඳහා හේතු දක්වන්න.

(ලකුණු 20)

2) 'රෝම ලන්දේසි නීතිය එනයින්ම ශ්‍රී ලංකාවේ පොදු නීතිය ලෙස වර්තමානයේ දී සැලකිම සාධාරණ නොමැත.'

ඉහත ප්‍රකාශය සමග ඔබ එකඟ වන්නෙහිද?
ඔබේ පිළිතුර විවේචනාත්මකව සාකච්ජා කරන්න.

(ලකුණු 20)

3) ඉංග්‍රීසි නීතිය (ව්‍යවස්ථාපිත නීතිය) ශ්‍රී ලංකාව තුළට නොයෙකුත් ආකාරයන් තුළින් ගෙන එනු ලැබූ අතර එකී ආකාරයන් සැකෙවින් සාකච්ජා කරන්න.

(ලකුණු 20)

4) සිරිතක් නීතියක් බවට පත්වීමට නම් යම් යම් කොන්දේසීන් ඉටු කිරීම අවශ්‍ය වේ. සිරිතක් නීතියක් වීමට බලපාන කොන්දේසි මොනවාද යන්න විස්තර කරන්න.
උචිත අයුරු නඩු තීන්දු මගින් ඔබගේ පිළිතුර සනාථ කළ යුතු වේ.

(ලකුණු 20)

5) අධිකරණ පූර්ව නිදර්ශන න්‍යාය යන්න හඳුන්වා දී එහි ඇති වාසි හා අවාසි සාකච්ජා කරන්න.

(ලකුණු 20)

6) උඩරට නීතියේ යෙදීම කෙරෙහි විලියම්ස් ඒ රොබට්සන් (1886) 8 SCC 36 නඩු තීන්දුවේ බල පෑම සාකච්ජා කරන්න.

(ලකුණු 20)

7) 'ශ්‍රී ලංකාව තුළ ක්‍රියාත්මක මුස්ලිම් නීතිය ශ්‍රී ලංකාවටම ආවේනික වූ එකකි.'

ඉහත ප්‍රකාශය සමග ඔබ එකඟ වන්නෙහිද?
ඔබේ පිළිතුර විවේචනාත්මකව අගයන්න.

(ලකුණු 20)

8) 'තේසවලමී නීතිය යටතේ, එම නීතියෙන් පාලනය වන කාන්තාවකට සිය දේපළ අයිතිය පිළිබඳව නොයෙකුත් සීමාවන් පවතින අතර, එම නිසා එවැනි කාන්තාවක් අසාධාරණයට ලක්වේ.'

ඉහත ප්‍රකාශය විවේචනාත්මකව අගයන්න.

(ලකුණු 20)